


ගාථ සන්න සහිත

# වසල සූත්‍රය

භාවසන්න සහිත

# වසල සූත්‍රය

සහ

# මෛත්‍රී භාවනාව.

විද්‍යෝදය පිරිවෙණේ උපාචාර්‍ය්‍ය

පණ්ඩිත

වෙරගොඩ අමරමොලි ස්වාමින් වහන්සේ

වි සි න්

ශුද්ධකරණ ලදී.

ජේ. ඩී. ප්‍ර නා න් දු

වි සි න්

කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවනලදී.

2478

1934

# වසල සූත්‍රය.

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

එවමෙම සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, අථඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථියං පිණ්ඩාය පාවිසි. තෙන ඛො පන සමයෙන අග්ගිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනෙ අග්ගි පජ්ජලිතො හොති ආහුති පග්ගහිතා.

අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණයාහට දෙශනාකළ වසල සූත්‍රය මා විසින් මෙසේ අසනලදී; නොහොත් රජගහනුවර රුක්අත්තන වෘක්ෂමූල සමීපයේ සාදනලද විසිතුරු මණ්ඩපයේ ධර්ම සංගායනාවට ආසනාරූඪවූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ විසින් සූත්‍රපිටකයේ කුදුගොත්සඟියට අන්තර්ගතව අසනලද ප්‍රශ්නයට උත්තරදීමට එසේම ආසනාරූඪවූ ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ ඇසීම මෙසේ ප්‍රකාශකරන්ට පටන්ගත්සේක. එක්සමයෙක්හි බුදුන් සැවැත්නුවර අනේපිඬු සිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩවසනසේක. එකල්හි බුදුහු උදෑසන්හි හැඳ පෙරව පා සිවුරුගෙණ සැවැත්නුවරට පිඬුපිණිස වැඩිසේක. එකල අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ ගෙදර සමීපයේ ගිනිදෙවියාට පුදන වහ්නිය දිළිහුනේවේ, ගිනිපූජාවට උවමනා සියලු උපකරණද ග්‍රහණය කරණලදහ.

අථඛො භගවා සාවත්ථියං සපදානං පිණ්ඩාය චරමානො යෙන අග්ගිකභාරද්වාජස්ස බ්‍රාහ්මණස්ස නිවෙසනං තෙනුපසංකමි. අද්දසා ඛො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං දූරතොව ආගච්ඡන්තං දිස්වාන භගවන්තං එතදවොච.

ඉක්බිත්තෙන් සර්වඥයන්වහන්සේ සැවැත්නුවර ගෙපිළිවලින් පිඬුපිණිස හැසිරෙණසේක් අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ ගෙදර යම් තැනෙක්හිද එතැන්හි වැඩිසේක. අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණ තෙම දුරදීම වැඩමවන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. (එසේ) දුටු සර්වඥයන්වහන්සේට මේ (මතුපහලවෙන) වචනය කීයේය.

තත්‍රෙව මුණ්ඩක! තත්‍රෙව සමණක! තත්‍රෙව වසලක! තිට්ඨාහීති එවං වුත්තෙ භගවා අග්ගිකභාරද්වාජං බ්‍රාහ්මණං එතදවොච. ජානාසි පන ත්වං බ්‍රාහ්මණ වසලං වා වසලකරණෙ වා ධම්මෙති; න ඛ්වාහං භො ගොතම ජානාමි වසලං වා වසලකරණෙ වා ධම්මෙ; සාධු මෙ භවං

ගොතමො තථා ධම්මං දෙසෙතු යථාහං ජානෙය්‍යං වසලං වා වසල කරණෙ වා ධම්මෙති; තෙන හි බ්‍රාහ්මණ සුණාහි සාධුකං මනසි කරොහි භාසිස්සාමීති එවමෙභොතිඛො අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවතො පච්චස්සොසි භගවා එතදවොච.

තිත්දිතවූ මුණ්ඩකය! එහිම සිටුව, තිත්දිතවූ ශ්‍රමණය! එහිම සිටුව, තිත්දිත සැඩොල (මැතනැවිත්) එහිම සිටුවයි; මෙසේ කීකල්හි සම්බුද්ධයන් වහන්සේ අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණයාහට මෙසේ වදාළසේක. බ්‍රාහ්මණය තොපි වනාහි චණ්ඩාලයා හෝ සැඩොල්බවට පමුණුවන ධර්මයන් හෝ දන්නෙහිද? භවත් ගෞතමයෙනි මම වනාහි වසලයා හෝ වසලබවට පමුණුවන ධර්මයන් හෝ නොදනිමි. භවත් ගෞතමයෙනි වසලයා හෝ වසලබවට පමුණුවන ස්වභාවන් හෝ යම්සේ මම දැනගණිම්ද එසේ මට ධර්මදේශනා කලොත් යහපතැයි (කීය.) එසේවීනම් බ්‍රාහ්මණය මනාකොට අසව. මනාව සිහිකරව. (තට) දෙශනාකරන්නෙමියි [වදාළකල්හි] එසේය පින්වතුනි යි කියා අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණතෙම බුදුන්ට ප්‍රතිවචන දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මේ මතු ප්‍රකාශවෙන ධර්මය වදාළසේක.

1 කොධනො උපනාහී ච – පාපමක්ඛී ච යො නරො,
විපන්නදිට්ඨි මායාවී – තං ජඤ්ඤා වසලො ඉති.

යම් සත්වයෙක්තෙම කිපෙන ස්වභාවෙන් යුක්තවේද, (එම ක්‍රොධය දියුණුකිරීමෙන් බඳිනලද) බද්ධවෛරය ඇත්තේද, අනුන්ගේ ගුණමකන සුලුවූයේ පව්ටෙකු වේද, විපර්‍යාසවූ දෘෂ්ටි ඇත්තේද හෙවත් සම්‍යක්දෘෂ්ටියෙන් තොරවූයේද, තමන්ගේ වරදවසන සුලුවූ ප්‍රයොගයන් යුක්තවේද, මෙසේ හීනධර්මයන් පවත්වන හෙයින් ඔහු වසලයයි දැනගනුව කියා පළමුකොට අග්ගිකභාරද්වාජ නම් බ්‍රාහ්මණයාගේ ක්‍රොධ නිග්‍රහයකිරීමෙන් මේ ගාථාවෙන් පඤ්ච ප්‍රකාර වසල කෙනෙකු හෙවත් සැඩොලුන් පස්දෙනෙකු ගෙණ හැර දක්වා වදාළසේක.

2 එකජං වා ද්විජං වා පි – යොධ පාණානි හිංසති
යස්ස පාණෙ දයා නත්ථි – තං ජඤ්ඤා වසලො ඉති.

මේ ලොකයෙහි යම් සත්වයෙක් එක්වරක් උපන්නාවූද හෙවත් ජලාබුජාදී මවුකුසින් උපන්නාවූද, දෙවරක් උපන්නාවූද හෙවත් අණ්ඩජසංඛ්‍යාත බිජුවටින් උපන්නාවූද, ප්‍රාණීන් දිවිතොරකෙරේද හෙවත් ප්‍රාණඝාත කෙරේද, ප්‍රාණීන් කෙරෙහි යම් කෙනෙකුගේ දයාවක් හෙවත් කරුණාවක් නැත්තේද, එබඳු පුද්ගලයා වසලයෙකැයි හෙවත් සැඩොලෙක්යයි කියා මේ ගාථාවෙන් එක් වසලයෙකු ප්‍රකාශකලසේක.

3 යෝ හන්ති පරිරුන්ධති - ගාමානි නිගමානි ච,
නිග්ගාහකො සමඤ්ඤාතො - තං ජඤ්ඤා **වසලො** ඉති.

යම් සත්වයෙක් ගම් නියම්ගම් විනාශකෙරේද, සේනාව ලවා වටලාද යන මෙයින් නිග්‍රහකරන්නෙකැයි ප්‍රසිද්ධවේද, එබඳු පුද්ගලයා වසලයෙකැයි මේ ගාථාවෙන් එක් වසලයෙකු දක්විය.

4 ගාමෙ වා යදි වාරඤ්ඤෙ - යං පරෙසං මමායිතං
ථෙය්‍යා අදින්නං ආදියති - තං ජඤ්ඤා **වසලො** ඉති.

(යම් සත්වයෙක් වනාහි) ග්‍රාමයෙහි නොහොත් ගම් නියම් ගම් නගරවලද ඉදින් වනයෙහිද අනුන්ගේ මමත්වය ඇති යම් වස්තුවක් ස්වාමියා විසින් නොදෙනලදද (එය) සොරසිතින් පැහැර ගණීද හෙවත් අදත්තාදානයයි කියනලද සොරකම්කෙරේද, එබඳු පුද්ගලයා චණ්ඩාලයෙකැයි දැනගණුවයි මේ ගාථාවෙන්ද එක් වසලයෙකු ප්‍රකාශකළසේක.

5 යො හවෙ ඉණමාදාය - චුජ්ජමානො පලායති,
නහි තෙ ඉණමත්ථීති - තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක්වනාහි (උකසක් තබා හෝ නොතබා හෝ මෙපමණ කලකින් පොලියත් සමග දෙමි කියා, හෝ) නයගෙණ (මුදල් දුන්නහු නැවත අවුත් මාගේ නය දෙවයි ඉල්ලූකල්හි) නොපගෙන් මා ගත් නයක් නැත්තේ යයි කියා (නයගත්බවට කවර සාක්‍ෂියක් දැයි තර්ජනය කෙරෙමින්) පලායන්නේද. එබඳු පුද්ගලයා සැඩොලෙකැ යි දැන ගණුවයි මේ ගාථාවෙන්ද එක් සැඩොලෙකු ප්‍රකාශ කළ සේක.

6 යො වෙ කිඤ්චික්ඛකම්‍යතා - පන්ථස්මිං වජන්තං ජනං,
හන්ත්වා කිඤ්චික්ඛමාදෙති - තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක්තෙම (ස්වල්පවූ හෝ) කිසිවක් කැමැත්තෙන් මාර්ගයෙහි යන්නාවූ (ස්ත්‍රී හෝ පුරුෂ හෝ) ජනයෙකු මරා හෝ කොටා හෝ කිසිවක් පැහැරගන්නේද, හෙවත් මගයන්නවුන් මරා දමා හෝ තලා දමා හෝ බඩු පැහැරගණිමින් මන්කොල්ලකන්නේද එබඳු පුද්ගලයා වසලයෙකැයි දනුවයි මේ ගාථාවෙන්ද එක් වසලයෙකු දක්වා වදාළ සේක

7 යො අත්තහෙතු පරහෙතු - ධනහෙතු ච යො නරො,
සක්ඛිපුට්ඨො මුසා බ්‍රූති - තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක්තෙම තමා හේතුකොටගෙණද, තමන්ගේ බන්ධුමිත්‍රාදී අනුන් හේතුකොටගෙණද, ධනධාන්‍ය ගම්බිම් ආදී වස්තු හේතු කොටගෙණද, සාක්‍ෂ්‍ය විචාරණ ලදුව යම් සත්වයෙක් බොරු කියාද හෙවත් යම්කිසි ලාභප්‍රයෝජනයක් උදෙසා බොරු සාක්‍ෂිකියාද, එබඳු පුද්ගලයා සැඩොලෙකැයි දැනගනුවයි, මේ ගාථාවෙන් එක් වසලයෙකු දැක්වූසේක.

8 යො ඤාතීනං සඛානං වා – දාරෙසු පතිදිස්සති,
සහසා සම්පියෙනාති – තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක්තෙම නෑයන්ගේ හෝ යහළුවන්ගේ හෝ භාර්‍යාවන් කෙරෙහි බලාත්කාරයෙන් එකක්හුගේ ප්‍රේමයෙන් හෝ උභය ප්‍රේමයෙන් හෝ ඉක්ම පවත්නාබව දක්නාලැබේද නොහොත් අනුන් සන්තක ස්ත්‍රීන් සමග අනාචාර ධර්මයෙහි හැසිරේද, එබඳු පුද්ගලයා වසලයෙකැයි දනුවයි, මේ ගාථාවෙනුදු එක් සැඩොලෙකු දක්වා වදාළසේක.

9 යො මාතරං වා පිතරං වා – ජිණ්ණකං ගතයොබ්බනං,
පහුසන්තො න භරති – තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක් තෙම දුර්වලවූ වයෝවෘද්ධවූ මෑනියන් හෝ පියානන් හෝ (නොහොත් මවුපියන්ද ශරීර දුර්වලවූවන්ද වයෝවෘද්ධයන්ද) පොහොසත් තැනැත්තේ (ආහාර පානවස්ත්‍රාදිය දීමෙන්) පෝෂ්‍යය නොකෙරේද, එබඳු පුද්ගලයා වසලයෙකැයි දැනගණුවයි, මේ ගාථාවෙන් එක් සැඩොලෙකු ගෙණහැර දක්වා ප්‍රකාශ කළසේක.

10 යො මාතරං වා පිතරං වා – භාතරං භගිනිං සසුං,
හනති රොසෙති වාචාය – තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක් මවුපියන්ට හෝ සහෝදර සහෝදරියන්ට හෝ නැදිමයිලන්ට අතින් පයින් පහරදේද, ක්‍රෝධ උපදවන වචනයෙන් පරුෂබස් කියාද, එබඳු පුද්ගලයා චණ්ඩාලයෙකැයි දැනගණුවයි මේ ගාථාවෙන් එක් චණ්ඩාලයෙකු ප්‍රකාශකළ සේක.

11 යො අත්ථං පුච්ඡිතො සන්තො – අනත්ථමනුසාසති,
පටිච්ඡන්නෙන මන්තෙති – තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක්තෙම මෙලොව පරලොව වැඩ සංඛ්‍යාත කාරණයක් ඇදහිලි වශයෙන් විචාරණලදුව අවැඩක්ම ප්‍රකාශකෙරේද (අප්‍රකටව) සැඟවීම් වශයෙන් මන්ත්‍රණය කෙරේද, ඒ පුද්ගලයා වසලයෙකැයි දැනගණුවයි මෙයින් එක් සැඩොලෙකු ප්‍රකාශ කෙළේය.

12 යො කත්වා පාපකං කම්මං – මා මං ජඤ්ඤාති ඉච්ඡති,
යො පටිච්ඡන්නකම්මන්තො – තං ජඤ්ඤා **වසලො** ඉති.

යම් ගෘහස්ථ ප්‍රව්‍රජිතයෙක් පව්කම්කොට මා කිසිවෙක් නොදනීවායි කැමතිවේද, යමෙක්තෙම (අනුන් නොදන්නාලෙස) සඟවා කරණලද ලාමක ක්‍රියා ඇත්තේද, එබඳු පුද්ගලයා වසලයෙකැයි දනුවයි මේ ගාථාවෙන් සැඬොලුන් දෙදෙනෙකු ප්‍රකාශකළ සේක.

13 යො වෙ පරකුලං ගන්ත්වා – භුත්වාන සුචිභොජනං,
ආගතං න පටිපූජෙති – තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක් වනාහි බන්ධුමිත්‍රාදි අනුන්ගේ ගෙදරකට පැමිණ ප්‍රණීතවූ භොජන අනුභවකොට නැවත ඒ ගෘහයෙන් තමන්ගේ ගෙදොරට පැමිණි කෙනෙකුට සංග්‍රහවශයෙන් කිසිවක් නොදේද, ඒ පුද්ගලයා වසලයෙකැයි දැනගණුවයි මෙයින් එක් වසලයෙකු ගෙණහැර දක්වා වදාළසේක.

14 යො බ්‍රාහ්මණං වා සමණං වා – අඤ්ඤං වා පි වනිබ්බකං,
මුසාවාදෙන වඤ්චෙති – තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක්තෙම බ්‍රාහ්මණ කෙනෙකුත් හෝ ශ්‍රමණ කෙනෙකුත් හෝ අනිකුදු යාචකයන් හෙවත් ශ්‍රමණ බ්‍රාහ්මණ යාචකයන් තමන්ගේ ගෙදොරට පැමිණිකල බොරුවෙන් රවටාද, ඔහු වසලයෙකැයි දනුවයි මෙයින් එක් සැඩොලෙකු ප්‍රකාශකළසේක.

15 යො බ්‍රාහ්මණං වා සමණං වා – භත්තකාලෙ උපට්ඨිතෙ,
රොසෙති වාචා න ච දෙති – තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක්තෙම බ්‍රාහ්මණයෙකු හෝ ශ්‍රමණකෙනෙකු හෙවත් ශ්‍රමණ බ්‍රාහ්මණකෙනෙකු බත්වෙලාවට පැමිණිකල්හි නොහොත් බත්වේලෙහි එළඹිකල්හි නුසුදුසු වචන කියමින් රොස් උපදවාද, එබඳු යාචකකෙනෙකුට කිසිවක් නොදේද, එබඳු පුද්ගලයා වසලයෙකැයි දැනගණුවයි මෙයින් එක් සැඩොලෙකු ගෙණහැර දක්වා වදාළසේක.

16 අසතං යොධ පබ්‍රෑති – මොහෙන පලිගුණ්ඨිතො,
කිඤ්චික්ඛං නිජිගිංසානො – තං ජඤ්ඤා **වසලො** ඉති.

මේ ලෝකයෙහි යමෙක්තෙම මෝහයෙන් වැසුනේ කිසි දෙයක් නොදී වලකා මගඅරිමින් අසත්පුරුෂ වචන කියාද, නොහොත් බොරුතෙපුල් කියාද, එබඳු පුද්ගලයා වසලයෙකැයි දනුවයි මේ එක් සැඬොලෙකු වදාළසේක.

17 යො චත්තානං සමුක්කංසෙ – පරඤ්ච මවජානති,
නිහීනො සෙන මානෙන – තං ජඤ්ඤා **වසලො** ඉති.

මාන්නය කරණකොට ගෙණ හෙවත් උඩඟු හේතුවෙන් යමෙක්තෙම තමන් උසස් කෙරේද, අනුන්ට නිගාකරමින් හෙළා දකීද, එබඳු පුද්ගලයා වසලයෙකැයි දැනගණුවයි මේ ගාථාවෙන් විප්‍රකාරවූ වසලකෙනෙකු ගෙණහැර දක්වා වදාළසේක.

18 රොසකො කදරියො ච – පාපිච්ඡො මච්ඡරී සඨො,
අහිරිකො අනොත්තාපි – තං ජඤ්ඤා **වසලො** ඉති.

අනුන්ට රොස් (තරහ) උපදවාද පින්කිරීම් වලකන තද මසුරුසිත් ඇත්තේද, ලාමක ඉච්ඡාවට කැමති වේද, ලාභ

සත්‍ථානාදියට මසුරුද, නැති ගුණය ප්‍රකාශකිරීමයයි කියනලද සඨ බැවින් යුක්තවේද, පවට ලජ්ජා නැත්තේද, පවට භයනැත්තේද, එබඳු පුද්ගලයා වසලයෙකැයි දැනගණුවයි මේ ගාථාවෙන් සප්ත ප්‍රකාරවූ වසලකෙනෙකුන් ගෙණහැර දක්වා වදාළසේක.

19 යො බුද්ධං පරිභාසති – අථවා තස්ස සාවකං,
පරිබ්බාජං ගහට්ඨං වා – තං ජඤ්ඤා **වසලො** ඉති.

යමෙක් බුදුන්ට පිරිහෙලාද හෙවත් බුදුන් වහන්සේ සියල්ල නොදත් කෙනෙක්යයි අගුණ කියාද, බුද්ධ ශ්‍රාවකයන්ට පිරිහෙලාද, බාහිර තාපසයයි කියනලද පරිබ්‍රාජිකයන්ට පිරිහෙලාද, උපාසකවූ හෝ නුවූ හෝ ගෘහස්ථයන්ගේ නැති අගුණ ප්‍රකාශකෙරේද, එබඳු පුද්ගලයා වසලයයි දතුවයි මේ ගාථාවෙන් ඕප්‍රකාර සැඬොල් කෙනෙකුන් ප්‍රකාශකළ සේක.

20 යො වෙ අනරහා සන්තො – අරහං පටිජානති,
චොරො සබ්‍රහ්මකෙ ලොකෙ – එ සො ඛො **වසලාධමො**.
එතෙ ඛො **වසලා** වුත්තා – මයා යෙ වො පකාසිතා.

රහත් නුවූ යමෙක් තෙම එකාන්තයෙන් රහතෙක්යයි අඟවාද, ඒ පුද්ගලතෙම බ්‍රහ්මයන් සහිත සියලු ලොකයෙහි පළමු වෙනි සොරෙක් වේ හෙවත් බුදු සස්නෙහි ලොකොත්තර ධර්මය හානි කරන්නාවූ චණ්ඩාලයන්ගෙන් අධමවූ සොරෙක් වේ. මා විසින් තොපට යම් වසල පුද්ගල කෙනෙක් ප්‍රකාශකොට දක්වනලද්දාහු ද ඒ වසලයෝ වනාහි ආයුෂ කර්ම වශයෙන් දක්වනලද්දෑහු වෙත්. මෙසේ එක් සැඬොලෙකු ප්‍රකාශකළ සේක.

21 න ජච්චා වසලො හොති – න ජච්චා හොති බ්‍රාහ්මණො,
කම්මනා වසලො හොති – කම්මනා හොති බ්‍රාහ්මණො.

21 ජාතිය හෙතුකොටගෙණ සැඬොල් නොවේ, ජාතිය හෙතු කොටගෙණ (උත්තමයයි කියනලද) බ්‍රාහ්මණද නොවේ, පව්වූ හීන ලාමක ක්‍රියාවෙන් සැඬොල්වේ. යහපත් ක්‍රියා කරණකොට ගෙණ උත්තමයයි කියනලද බ්‍රාහ්මණවේයයි ප්‍රකාශකළේය.

22 තදමිනාපි ජානාථ – යථාමෙදං නිදස්සනං,
චණ්ඩාලපුත්තො **සොපාකො–මාතඞ්ගො** ඉති විස්සුතො.

28 සො යසං පරමං පත්තො – මාතඞ්ගො යං සුදුල්ලභං,
අගඤ්ඡුං තස්සුපට්ඨානං – ඛත්තියා බ්‍රාහ්මණා බහූ.

24 සො දෙවයානමාරුය්හ – විරජං සො මහාපථං,
කාමරාගං විරාජෙත්වා – බ්‍රහ්මලොකූපගො අහු,
න තං ජාති නිවාරෙසි – බ්‍රහ්මලොකූපපත්තියා.

22 යම්සේ මාගේ මේ උපමා දැක්වීමෙන් ඇද්ද ඒ ජාතිය කරණ කොටගෙණ සැඬොල් නොවන බව මෙයින් දැනගණුව. සැඬොල් පුත්වූ සොපාකයයි කියනලද මාතඞ්ගයයි ප්‍රසිද්ධවූ

ඒ මේ පණ්ඩිත තෙම නොලැබිය හැකිවූ උතුම්වූ යසසට පැමිණියේද ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදී බොහෝදෙන ඒ හීන ජාතියෙහි උපන් මාතඞ්ග පණ්ඩිතයාහට උපස්ථානය පිණිස එළඹුනෝය.

යම් සමෘද්ධිමත්තෙක් ඇද්ද ඒ ආශ්‍රවයක්ෂීවත් පුරුෂතෙම කාම රාගාදි කෙලශයන්ගෙන් වෙන්වූ මහොත්තමයන් එළඹෙන මාර්ගයවූ දෙව්ලොකොත්පත්තියට එළඹීමට හැකිවූ අෂ්ට සමාපත්ති සංඛ්‍යාත දිව්‍යයානාවට නැගී කාමභව නිශ්‍රිත කාම රාගය පහකොට බ්‍රහ්ම ලොකයට පැමිණියේ විය. ඒ මාතඞ්ගයාගේ බ්‍රහ්මලොකොත්පත්ති හෙතුවෙන් ඒ හීනජාති භාවය නොවැලැක්වූයේ විද, ඒ උත්තම ක්‍රියා උත්පත්ති හෙතුවෙන් හීනජාතිභාවය ප්‍රහීණකළේය.

25 අජ්ඣායකා කුලෙ ජාතා – බ්‍රාහ්මණා මන්තබන්ධවා,
තෙ ච පාපෙසු කම්මෙසු – අභිණ්හමුපදිස්සරෙ.

26 දිට්ඨෙව ධම්මෙ ගාරය්හා – සම්පරායෙ ච දුග්ගතිං,
න තෙ ජාති නිවාරෙති – දුග්ගච්චා ගරහාය වා.

මන්ත්‍ර හැදෑරීමෙන් කල් යවන ප්‍රසිද්ධ බ්‍රාහ්මණ කුලයෙහි උපන්නාවූ වෙදයම නොහොත් මන්ත්‍රයම පිහිටකොට ඇති බ්‍රාහ්මණයෝ ප්‍රාණඝාතාදි පව් කිරීමෙන් නිතරම දක්නාලැබෙද්ද, ඒ බ්‍රාහ්මණයෝ

මෙලොවදීම නින්දාවට පැමිණෙන්නෝ වෙත්. පරලොවදී දුකට පිහිටවූ හෙයින් දුගතිනම්වූ නරකාදි සතර අපායට පැමිණෙන්නෝ වෙත්. ජාතිය උතුමැයි සැලකීමෙන් පව්කරණ යම්කෙණෙක් වෙද්ද, ඒ සත්වයෝ පරලොව අපායෙන් හෝ මෙලොව නින්දාවෙන් හෝ නොනවත්නාහුයයි දක්වා වදාළසේක.

27 න ජච්චා වසලො හොති – න ජච්චා හොති බ්‍රාහ්මණො,
කම්මනා වසලො හොති – කම්මනා හොති බ්‍රාහ්මණො.

ජාතිය හෙතුකොට ගෙණ සැඩොල් නොවන්නේය. ජාතිය හෙතුකොටගෙණ (උතුම් ජාතියයි කියනලද) බ්‍රාහ්මණ නොවන්නේය (ක්‍රොධ ඊර්ෂ්‍යා මාන්න මායාදි හීනවූ පාප) ක්‍රියාවෙන් සැඩොල් වන්නේය. (ක්‍රොධාදී පාපකර්මයෙන් තොරවූ කරුණා මෛත්‍රී ආදි යහපත් ක්‍රියාවෙන් (උතුම් ජාතියයි කියනලද) බ්‍රාහ්මණ වන්නේ යයි මෙතෙකින් අග්ගිකභාරද්වාජ බ්‍රාහ්මණයාහට මේ වසලයයි කියන ලද ලොකයේ සම්මත වසයෙන් අන්තිම හීනජාති නම්වූ රොඩින්ගේ ලක්ෂණ ගෙණහැර දක්වා වදාළසේක.

එවං වුත්තෙ අග්ගිකභාරද්වාජො බ්‍රාහ්මණො භගවන්තං එතද වොච අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භගවන්තං ගොතමං සරණං ගච්ඡාමි, ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

(වසලයන් ප්‍රකාශකවූ මේ සූත්‍රය) මෙසේ වදාළ කල්හි අග්ගික භාරවාජ නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කී. පින්වත් ගෞතමයන් වහන්ස! (ඔබවහන්සේගේ ධර්මදේශනාව) ඉතාම යහපත්ය. භවත් ගෞතමයන් වහන්ස! (ඔබවහන්සේගේ ධර්මදේශනාව) ඉතා ප්‍රණීතයයි. (කියා බුදුන්ට සතුති කෙළේය.) භවත් ගෞතමයන්වහන්ස, (යමෙකු විසින්) මුනින් තබනලද භාජනයක් උඩුකුරුකොට යම්සේ තබන්නේද, යමකින් වැසීතිබෙන්නාවූ යම් කිසි වස්තුවක් විවෘතකොට දක්වන්නේ යම්සේද, මග්මුළාවූ කෙනෙකුට (මේ මගය මෙසේ යවයි කියා) මග කියන්නේ යම්සේද අඳුරුවූ ස්ථානයෙහි ඇස් ඇති පුරුෂයෙක් නීලපීතාදී සිතුයම් රූප. දකිවයි තෙල් පොවා දල්වනලද පන්දමක් නොහොත් පහනක් යම්සේ දරන්නේද, එමෙන්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ප්‍රකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලද්දේය. ඒ බණ අසනු ලැබූ මම භාග්‍යවත් ගෞතම ගොත්‍රයෙහි වූ සර්වඥයන් වහන්සේද, සපර්යාප්තික නවලොකොත්තර සධර්මය ද, අෂ්ටාර්‍ය පුද්ගල මහා සංඝරත්නයද යන ත්‍රිවිධරත්නය සරණකොට යමි. පින්වත් ගෞතම ගොත්‍රොද්භූත සර්වඥයන් වහන්සේ මා අද පටන් ජීවිතාන්තය දක්වා තිසරණගත උපාසකයෙකැයි කියා දරණසේක් වයි සැලකරමින් අග්ගිකභාරමාජ නම් බ්‍රාහ්මණතෙම තමන් උපාසකභාවය ප්‍රකාශකෙළේය

මේ දෙශනාව අයහපත් ක්‍රියා ඇති ගෘහස්ථ ප්‍රව්‍රජිත දෙපක්ෂයටම එකාකාර බැවින් මෙහි 20 වෙනි ගාථාවට සම්බන්ධ ශාසනයේ පළමු වෙනි හොරු සම්බන්ධ කාරණා අර්ථකථාවේ ගෙණහැර දක්වා තිබෙන බැවින් එයද මෙහි අඩංගුවේ.

සාසනෙ පරිසම්පත්ති ආදීහි පච්චයාදීහි විලුම්පනතා යථා-පඤ්චිමෙ භික්ඛවෙ මහාචොරා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං, කතමෙ පඤ්ච ඉධ භික්ඛවෙ එකච්චස්ස මහාචොරස්ස එවං හොති කුදස්සුනාමාහං සතෙන වා සහස්සෙන වා පරිවුතො ගාමනිගමරාජධානීසු ආහිණ්ඩිස්සාමි හනන්තො ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචාපෙන්තො. සො අපරෙන සමයෙන සතෙන වා සහස්සෙන වා පරිවුතො ගාමනිගම රාජධානීසු ආහිණ්ඩති හනන්තො. ඝාතෙන්තො ඡින්දන්තො ඡෙදාපෙන්තො පචන්තො පාචාපෙන්තො. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චස්ස පාපභික්ඛුනො එවං හොති කුදස්සුනාමාහං සතෙන වා සහස්සෙන වා පරිවුතො ගාමනිගමරාජධානීසු චාරිකං චරිස්සාමි සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො ගහට්ඨානඤ්චෙව පබ්බජිතානඤ්ච චීවර පිණ්ඩපාත

සෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති. සො අපරෙන සමයෙන සතෙන වා සහස්සෙන වා පරිවුතො ගාමනිගමරාජධානීසු චාරිකං චරති සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො ගහට්ඨානඤ්චෙව පබ්බජිතානඤ්ච ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අයං භික්ඛවෙ **පඨමො මහාචොරො,** සන්තො සංවිජ්ජමානො ලොකස්මිං. පුනචපරං භික්ඛවෙ ඉධෙකච්චො පාපභික්ඛු තථාගතප්පවෙදිතං ධම්මවිනයං පරියාපුණිත්වා අත්තනො දහති; අයං භික්ඛවෙ **දුතියො මහාචොරො** සන්තො සංවිජ්ජමානො ලොකස්මිං. පුනචපරං භික්ඛවෙ ඉධෙකච්චො පාපභික්ඛු අපරිසුද්ධං බ්‍රහ්මචාරිං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරන්තං අමූලකෙන අබ්‍රහ්මචරියෙන අනුද්ධංසෙති, අයං භික්ඛවෙ **තතියො මහාචොරො** සන්තො සංවිජ්ජමානො ලොකස්මිං. පුනචපරං භික්ඛවෙ පාපභික්ඛු යානි තානි සංඝස්ස ගරුභණ්ඩානි ගරුපරික්ඛාරානි, සෙය්‍යථිදං ආරාමො ආරාමවත්ථු විහාරො විහාරවත්ථු මංචො පීඨං භිසි බිම්බොහනං ලොහකුම්භි ලොහභාණකං ලොහකටාහො වාසී ඵරසු කුඨාරි කුදාල නිඛාදනං වල්ලි වෙලු මුඤ්ජා බබ්බජං තිණං මත්තිකා දාරුභණ්ඩං තෙහි ගිහී සංගණ්හාති උපලාපෙති අයං භික්ඛවෙ **චතුත්ථො මහාචොරො** සන්තො සංවිජ්ජමානො ලොකස්මිං සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අයං අග්ගො මහාචොරො; යො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපතීති. තත්ථ ලොකිකචොරා ලොකිකමෙව ධනධඤ්ඤාදිං ථෙනෙන්ති සාසනෙ වුත්තචොරෙසු පඨමො තථාරූපමෙව චීවරාදිපච්චයමත්තං, දුතියො පරියත්තිධම්මං, තතියො පරස්ස බ්‍රහ්මචරියං, චතුත්ථො සංඝික ගරුභණ්ඩං, පඤ්චමො ඣාන සමාධි සමාපත්ති මග්ගඵලප්පභෙදං ලොකිය ලොකුත්තර ගුණ ධනං ලොකියං ච චීවරාදි පච්චය ජාතං; යථාහ "අයං භික්ඛවෙ රට්ඨ පිණ්ඩො භුත්තො"ති තත්ථ ය්වායං **පඤ්චමො මහාචොරො** තං සන්ධායාහ භගවා **චොරො සබ්‍රහ්මකෙති"** සොති; සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අයං අග්ගො මහාචොරො යො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපතී"ති එවං ලොකිය ලොකුත්තර ධනථෙනනතො අග්ගො මහාචොරොති වුත්තො.

මෙහි දක්වනලද 20 වෙනි ගාථාව ප්‍රතිබද්ධව ලොකයෙහි මහ සොරු පස්දෙනෙක. ඊට උපමාකොට ප්‍රකාශකරණලද බුදුසස්නෙහි සොරු පස්දෙනෙකි.

ඒ ගැණ ප්‍රකාශකරණ පාලි පාඨයෙන් පෙන්වන සොරු පස්දෙනාගේ අභිප්‍රාය සංක්ෂෙපයෙන් මෙහි දක්වනු ලැබේ.

මහණෙනි මේ ලෝකයෙහි සමහර සොරෙකුට මෙබඳු කල්පනාවක් වේ. එනම්:-මම කවර දවසෙක සියදහස්ගණන් පිරිවර ඇතුව ගම්නියම්ගම් රාජධානිවල හිංසා පීඩා කරමින් ඇවිදිම්ද, මෙසේ ඔහු මේ කල්පනාව ඇති ඒ සොරුන් සියදහස් ගණන් පිරිවර ඇතුව ගම් නියම්ගම් රාජධානිවල හිංසා පීඩා කරමින් ඇවිදිද, විලුම්පනය කෙරේද; එමෙන්ම මේ සස්නෙහි සමහර පවිටු මහණෙකුටත් මෙසේ කල්පනාවකි; මම ගරුසත්කාර බුහුමන් ඇතුව පූජිතව ගිහි පැවිද්දන්ගේ සිවුපසය ලබමින් සියදහස් ගණන් පිරිවර ඇතුව ගම්නියම්ගම් රාජධානීවල කවදා ඇවිදිම්දැයි මෙසේ සිතූ ඒ මහණ යථොක්ත ක්‍රමයෙන් ගම් නියම්ගම් රාජධානිවල ගිහි පැවිද්දන්ගේ සිවුපසය ලබා ඇවිදින්නේය. මහණෙනි මේ තෙම මේ ලෝකයෙහි වූ **පළමුවෙනි සොරෙකා.**

මහණෙනි මේ සස්නෙහි සමහර පවිටු මහණෙක් බුදුන් වදාළ ධර්මවිනය පමණක් පුහුණුකොටගෙණ ප්‍රතිපත්ති විරහිතව වෙසේද, ලොකයෙහි **මේ දෙවෙනි මහසොරා** නම් වේ.

මහණෙනි මේ සස්නෙහි සමහර පවිටු මහණෙක් අපිරිසිදු බ්‍රහ්මචර්‍ය්‍යා ඇතිව පිරිසිදු බ්‍රහ්මචාරි කෙනෙකුට අමූලික බොරු චෝදනා කෙරේද, ඔහු මෙලොව **තුන්වෙනි මහසොරා** නම් වේ.

මහණෙනි යම් පවිටු මහණෙක් සඞ්ඝසතු යම් ගරුබඩු ගරු පිරිකර ඇද්ද ඒවා නම්:- ආරාම විහාර කෙත් වත් ඇඳ පුටු කොට්ට මෙට්ටාදියද, ලෝ බඳනාදියද, වෑ පොරෝ කෙටේරි උදලු නියම්ද, වැල් හුණ තණ මැටි ලීදඬු මේ ආදි ගරු බඩු ගිහින්ට දෙමින් ගිහන් සිත් ගණීද, මේ මෙලොව **සතරවෙනි මහසොරා** නම් වේ.

මහණෙනි දෙව් මිනිස් බඹුන් සහිත ලොකයෙහි යමෙක් තමන්ට නැත්තාවූ උත්තරි මනුෂ්‍ය ධර්මයයි කියනලද ආර්‍ය්‍යගුණය අඟවමින් ප්‍රකාශකෙරේද, මේ තෙම අග්‍රවූ ශ්‍රෙෂ්ඨවූ **පස්වෙනි මහසොරා** නම් වේ.

ලෞකික සොරහු ලෞකික ධන ධාන්‍යාදියම පැහැරගණී, බුදුසස්නේ සොරුන් අතරෙන් පළමුවෙනි සොරා චීවරාදි සිවුපසය සොරකම් කෙරේ. දෙවෙනි සොරා පර්‍ය්‍යාප්තිධර්මය සොරකම් කෙරේ. තුන්වෙනි සොරා අනුන්ගේ බ්‍රහ්මචර්‍ය්‍යාව සහවයි. සතරවෙනි සොරා සාංඝික ගරු බඩු සොරකම් කෙරේ. පස්වෙනි සොරා ධ්‍යාන සමාපත්ත්‍යාදී මාර්ග ඵල ප්‍රභෙදවූ ලෞකික ලොකොත්තර ධනයද, ලෞකික සිවුපසයද සොරකම්කෙරේ. මහණෙනි තොප විසින් අනුන්ගේ සිවුපසය සොරකමින් වලඳින ලදදැයි කියා යම් මේ මහසොරු පස්දෙනෙක් ඇද්ද ඒ නිසා බුදුහු "චොරො සබ්‍රහ්මකෙ" යනාදිය වදාළේය. මහණෙනි යමෙක් දෙවියන් මරුන් බඹුන් මහණ බමුණන් සහිත සත්වයා ඇති දෙව් මිනිසුන් සහිත ලෝකයෙහි තමන්ට නැත්තාවූ උතුරු මිනිස් දහම්යයි කියනලද ආර්‍ය්‍යගුණය අඟවාද, මේ ලෞකික ලොකොත්තර ධන සොරකම් කාරණ හෙයින් ශ්‍රෙෂ්ඨවූ මහසොරායයි වදාරණ ලදී.

**නි මි.**

# මෛත්‍රී භාවනාව.

—— ०:० ——

සුඛං සුපිත්වාන සුඛං පබුජ්ඣති – සුත්තොසු පාපං සුපිනං න පස්සති
වණ්ණොමුඛෙ වස්සච විප්පසීදති – චිත්තං සමාධිං තුවටඤ්ච ගච්ඡති
පරප්පයුත්තාපි විසග්ගිසත්ථා – න තම්පි බාධෙන්ත්‍යමෙරාපි රක්ඛ
අමූළ්හකොයෙව කරොති කාලං – ආයුක්ඛයෙ බ්‍රහ්මනිවාසගාමී.

අස්මිං විහාරසරපබ්බතරුක්ඛගාමෙ
සබ්බෙසු දීපනගරෙසුපි චක්කවාළෙ,
දෙවා සුරා ගරුඩරක්ඛසනාගයක්ඛා
රක්ඛන්තු මං සකනුභාවබලෙන නිච්චං.

අහං අවෙරො හොමි, අව්‍යාපජ්ඣො හොමි, අනීඝො හොමි, සුඛී අත්තානං පරිහරාමි, අහං විය මය්හං ආචරියුපජ්ඣායා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු, අහං විය මය්හං හිතසත්තා අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු, ඉමස්මිං විහාරෙ සබ්බෙ භික්ඛූ අවෙරා හොන්තු, අව්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු, ඉමස්මිං විහාරෙ ඉස්සරජනා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං විහාරෙ සීමට්ඨකදෙවතා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං විහාරෙ සබ්බෙ සත්තා අවෙරා හොන්තු පෙ–සමන්තා ගොචර ගාමෙ ඉස්සරජනා අවෙරා හොන්තු–පෙ–සමන්තා ගොචර ගාමෙ සීමට්ඨකදෙවතා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං ජනපදෙ සීමට්ඨකදෙවතා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං ජනපදෙ සබ්බෙ සත්තා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං රට්ඨෙ ඉස්සරජනා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං රට්ඨෙ සබ්බෙ සීමට්ඨකදෙවතා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං රට්ඨෙ සබ්බෙ සත්තා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං රජ්ජෙ ඉස්සරජනා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං රජ්ජෙ සීමට්ඨකදෙවතා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං රජ්ජෙ සබ්බෙ සත්තා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං ලංකාදීපෙ ඉස්සරජනා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං ලංකාදීපෙ සීමට්ඨකදෙවතා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං ලංකාදීපෙ සබ්බෙ සත්තා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං ජම්බුදීපෙ ඉස්සරජනා අවෙරා හොන්තු-පෙ-ඉමස්මිං ජම්බුදීපෙ සීමට්ඨකදෙවතා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං ජම්බුදීපෙ සබ්බෙ සත්තා අවෙරා හොන්තු–පෙ–ඉමස්මිං චක්කවාළෙ ඉස්සරජනා අවෙරා හොන්තු-පෙ-ඉමස්මිං චක්කවාළෙ සීමට්ඨකදෙවතා

අවෙරා හොන්තු-පෙ-ඉමස්මිං චක්කවාළෙ සබ්බෙ සත්තා අවෙරා හොන්තු-පෙ-සමන්තා චක්කවාළෙසු ඉස්සරජනා අවෙරා හොන්තු-පෙ-සමන්තා චක්කවාළෙසු සීමට්ඨකදෙවතා අවෙරා හොන්තු-පෙ-සමන්තා චක්කවාළෙසු සබ්බෙ සත්තා අවෙරා හොන්තු-පෙ-අනන්තාපරිමාණෙසු චක්කවාළෙසු ඉස්සරජනා අවෙරා හොන්තු-පෙ-අනන්තාපරිමාණෙසු චක්කවාළෙසු සීමට්ඨකදෙවතා අවෙරා හොන්තු-පෙ-අනන්තාපරිමාණෙසු චක්කවාළෙසු සබ්බෙ සත්තා අවෙරා හොන්තු, අබ්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තු, සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ පුග්ගලා සබ්බෙ අත්තභාව පරියාපන්නා සබ්බා ඉත්ථියො සබ්බෙ පුරිසා සබ්බෙ අරියා සබ්බෙ අනරියා සබ්බෙ දෙවා සබ්බෙ මානුසා සබ්බෙ විනිපාතිකා සබ්බෙ අපාද දිපාද චතුප්පාද බහුප්පාදා අවෙරා හොන්තු, අබ්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිදරන්තු, අස්මිංවා දිසාය පුරත්ථිමාය දිසාය පුරත්ථිමාය අනුදිසාය දක්ඛිණාය දිසාය දක්ඛිණාය අනුදිසාය පච්ඡිමාය දිසාය පච්ඡිමාය අනුදිසාය උත්තරාය දිසාය උත්තරාය අනුදිසාය උපරිමාය දිසාය සබ්බෙ සත්තා අවෙරා හොන්තු-පෙ-හෙට්ඨිමාය දිසාය සබ්බෙ සත්තා අවෙරා හොන්තු, අබ්‍යාපජ්ඣා හොන්තු, අනීඝා හොන්තු, සුඛී අත්තානං පරිහරන්තූති.

1 පුරත්ථිමස්මිං දිසාභාගෙ – සන්ති දෙවා මහිද්ධිකා,
තෙ පි මං අනුරක්ඛන්තු – ආරොග්‍යෙන සුඛෙන ච.

2 දක්ඛිණස්මිං දිසාභාගෙ – සන්ති දෙවා මහිද්ධිකා,
තෙ පි මං අනුරක්ඛන්තු – ආරොග්‍යෙන සුඛෙන ච.

3 පච්ඡිමස්මිං දිසාභාගෙ – සන්ති දෙවා මහිද්ධිකා,
තෙ පි මං අනුරක්ඛන්තු – ආරොග්‍යෙන සුඛෙන ච.

4 උත්තරස්මිං දිසාභාගෙ – සන්ති දෙවා මහිද්ධිකා,
තෙ පි මං අනුරක්ඛන්තු – ආරොග්‍යෙන සුඛෙන ච.

5 පුරත්ථිමෙන ධතරට්ඨො – දක්ඛිණෙන විරූළ්හකො,
පච්ඡිමෙන විරූපක්ඛො – කුවෙරො උත්තරං දිසං
තෙ පි මං අනුරක්ඛන්තු – ආරොග්‍යෙන සුඛෙන චාති.

මෛත්‍රී භාවනාව නිමි.


## මෙම වසලසූත්‍රඅටුවාකථාවේ පුද්ගලවශයෙන් බෙ දී ම.

---

| | | |
|---|---|---|
| 1 | ගාථාවෙන් ක්‍රොධාදී පස්දෙනෙකි | 5 |
| 2 | ප්‍රයොග විපත්ති වශයෙන් ප්‍රාණහිංසක | 1 |
| 3 | දෙවෙනි ප්‍රයොග විපත්ති වශයෙන් ග්‍රාමනිගම නිග්‍රාහක | 1 |
| 4 | සොරකම් අවහාර වශයෙන් | 1 |
| 5 | නය වංචා වශයෙන් | 1 |
| 6 | බලාත්කාර සොරකම් මංකොල්ලකෑම් වශයෙන් | 1 |
| 7 | බොරු සාක්‍ෂ්‍ය වශයෙන් | 1 |
| 8 | මිත්‍රද්‍රොහී වශයෙන් | 1 |
| 9 | කෘතොපකාර නොසැලකීම් වශයෙන් | 1 |
| 10 | වෙහෙසකිරීම් වශයෙන් | 1 |
| 11 | සිත් වංචාකිරීම් වශයෙන් | 1 |
| 12 | වසනලද අයහපත් කර්මාන්ත වශයෙන් | 2 |
| 13 | දෙවෙනි අකෘතඥ වශයෙන් | 1 |
| 14 | වංචා වශයෙන් | 1 |
| 15 | දෙවෙනි වෙහෙසකිරීම් වශයෙන් | 1 |
| 16 | දෙවෙනි වංචා වශයෙන් | 1 |
| 17 | තමන් උසස්කිරීම් වශයෙන්ද අනුන් නීචකිරීම් වශයෙන්ද | 2 |
| 18 | ප්‍රයොගසය විපත්ති වශයෙන් | 7 |
| 19 | පිරිහෙළීම් වශයෙන් | 2 |
| 20 | ලෝකයේ පළමුවෙනි සොරු වශයෙන් | 1 |

මෙසේ පව්කම් කිරීම් වශයෙන් වසලයෝ තෙතිස්දෙනෙක් මේ වසල සූත්‍රයෙන් බුදුරජානන් වහන්සේ විසින් දක්වන ලදහ.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු